

# රු100,000 වටිනා පරෙවියෙක්

එක්තරා මිනිසෙක් පරෙවියෙකු සමගින් පාරේ රුදුරු ක්‍රීඩාවක් වැනි දෙයක නියැලී සිටියා. ඒ මිනිසා අනුකම්පා විරහිතව ඒ පරවියාගේ තටු ඉවත්කරමින් සිටියා. ඒ පරවියාගේ විලාපය ඒ රුදුරු මිනිසාගේ දෙසවන් මත පතිතවුනේ නෑ. තම අතට අසුවුනාවූ පරෙවියාගේ වේදනාත්මක විලාපය ඒ මිනිසාගේ සවන්වලට නම් මිහිරි නාදයක්ව පැවතුනා.

“ ඒයි.... නුඹ මොනවද ඔය කරගෙන ඉන්නේ....?” කියා එක්තරා මහත්මයෙකු ඔහුගෙන් ඇසුවා.

“ ඇයි.. ඔබට පේන්නේ නැද්ද? මම මේ පරෙවියාගේ තටු ගලවමින් ඉන්නේ. වේදනාවෙන් මිරිකෙන මේ පරෙවියාගේ විලාපය මටනම් සතුටක් ලබාදෙනවා. තටු සියල්ලම ඉවත්කලාට පස්සේ, මගේ ගෙදර ඉන්න බළලාට කන්න දෙනවා. කොච්චර නම් රසවත් කෑමක්වෙයිද ඌට....?” කියලා ඔහු වීදියේ සක්මන් කළාග

“ පරෙවියන් පියාසර කරන පිනිසයි මවා තිබෙන්නේ.. ඌව අත්හරින්න මිනිහෝ” කියා ඒ මහත්මයා පහත් හඬින් පැවසුවා.

“ ඒක ආයෙත් කියන්න... බලන්න පරෙවියන් අහසේ පියාඹනවා තමයි. ඇත්ත, නුමුත් ඌව මගේ උගුලට ගොදුරුවුනාට පසුව ඌ මටයි අයිති උරුම! උන්ගේ ඉරණම තීරණය කරන්නේ මමයි. හහ්.. හහ්.. හහ්..” කියා ඒ මිනිසා මහත් ගෝරනාඩුවක් දැම්මා. එවිට ඒ මහත්මයා, ඒ මිනිසාට ලංවී, “හ්ම්... මේ පරෙවියා ඔයා විකුණනවාද?” කියලා ඇහුවා.

“ විකුණන්නද?...” කැළඹුනු වික්ෂිප්ත සිතුවිල්ලකටපත් ඒ මිනිසා “ ඔබ මෙකා ගන්න හේතුව කුමක්ද...? කිසිම වටිනාකමක් නැති, කථකරන්න බැරි, ලස්සනකුත් නැති කැළෑ පරෙවියෙක් නේ...?”

“ හේතුව නුඹට කියන්න තරම් අවශ්‍යතාවයක් නැහැ. විකුණනවානම් ඌගේ වටිනාකම කීයද?

“ කුමන ගනණක් වුනත් ඔයා දෙන්න සූදානම්ද?... හොඳයි රුපියල් ලක්ෂයක් දෙන්න නුඹ සූදානම් ද?”

“ හ්ම්... හ්ම්... හරි දෙන්නම්” කියා ඒ මහත්මයා පැවසුවා.

“ එකම එක කැත කැළෑ පරෙවියෙකුගේ මිල රුපියල් ලක්ෂයක්ද?” කියා ඒ මිනිසාද අවට සිටි අයද විශ්මයට පත්වුනා. ඒත් ඒ මහත්මයා නිහඬව මුදල් ගනන්කර ඒ මිනිසාට එය දී පරෙවියා රැගෙන, සිඹ, නිදහසේ පරෙවියාට යන්නට හැර තමාද පාඩුවේ එම මාවතේ ඇවිද ගිය අයුරු දැක අනෙක් සියලුදෙනාම විශ්මයට පත්වුනා.

මේක තවත් එක් මනංකල්පිත කථාවක් කියා සමහරවිට ඔබට සිතේවි. බුද්ධිමත් කවුරු නමුත් මෙවැනි කැළෑ පරෙවියෙකුට මෙපමණ මුදලක් දෙයිද කියා ඔබ සිතනවාද?

ඔව්, ඔබ සිතන එක හරි. නමුත් බුද්ධියට නොහැගෙන තර්කානුකූල නොවන අසාමාන්‍යවූ මෙම සිද්ධිය ලෝකයේ සැබෑවටම සිදුවුනා! දේව අභිමුඛය භුක්ති විඳීමට දේව ස්වරූපයෙන් අප මවනු ලැබුවා. නමුත් දෙවියන්වහන්සේ ප්‍රතික්ෂේප කර විනාශය කරා යන්නට මිනිසා තීරණය කරා. දේව අභිමුඛයේ ප්‍රීතියට වඩා පාපයේ සතුට ඔහු තෝරාගත්තා. අපේ මාංශය තෘප්තිමත් කිරීමට අපි තෘෂ්ණාව, වස්තු තෘෂ්ණාව, ඉරිෂියාව, දූෂිත වචන, අඩිදඹර, මිනී මැරීම් වැනි දේවල් සිදුකරමින් පවතිනවා. මේ සියලුම පාපයන් මගින් අපව යක්ෂයාගේ දැලට හසුකරනවා. උගුලක් එසේත් නැත්නම් මලපතක් කියා නොදැන සිටි අප, අපගේ තත්වය අපට අවබෝධවන විට, හැගෙන විට ප්‍රමාදවී, කල්ගතවී තිබෙන්නට පුලුවන්. එවිට අප යක්ෂයාගේ ප්‍රාණ ඇපකරුවන් වී හමාරයි.



යක්ෂයාගේ අතේ වූ කෙලි බඩුවක්ව තිබූ අප, තමන්ගේ ස්වකැමැත්තට අනුව පීඩාවෙන් බේරන්න මාර්ග සෙව්ව නමුත් එය අපට ලැබුනේ නැහැ. නුමුත් අපගේ අදෝනාව... මොරගෑසීම යේසුස්වහන්සේගේ සවන්වලට ලංවී තිබුනා. යක්ෂයාගේ මලපතට හසුව, එම මරණීය රැහැනේ සිරවී සිටි අපව බලා යේසුසුවහන්සේ බැස ආවා... !

“ ඒයි... නුඹ මොනවද ඔය කරගෙන ඉන්නේ.....?”

“ ඇයි... ඔබට පේන්නේ නැද්ද...?” කියා උපහාසයෙන් යුක්තව යක්ෂයා පැවසුවාසේ අපහාසනලා. “ සියලු මනුෂ්‍යන්ට කරපුලෙසම අද දිනත් මිනිසුන්ට පීඩා කර, මවින්ගේ ප්‍රීතිය.

ඉවත්කර, පවුල් විනාශ කර, වීදිවල අඩදබර වීමට සලස්වා, සූදුව, බීමත්කම, වේශ්‍යාකම වැනිදේ කිරීමට තබා, කෝපය, රණ්ඩු, මිනීමැරීම්, දිවිනසාගැනීම් වැනි දේවල් සිදුවීමට ඉඩතබා, ඔවුන් ලැජ්ජාවට පත්කර වංක හෘදසාක්ෂිය කින්ද, වේදනාවකින්ද දඬුවම් පමුනුවනවා. මිනිසාගේ විනාශය, වැටීම දෙස බැලීම මට මහත් ප්‍රීතියක්'' කියා යක්ෂයා පැවසුවා.

“ ඒයි සාතන්... මිනිසා දෙවියන්වහන්සේ මවනු ලැබූ කෙනෙක්. ඔහු සමග නුඹට තිබෙන වැඩේ කුමක්ද?'' කියලා යේසුස්වහන්සේ ඇසුසේක.

“ ඒක දැන් පරණ කථාවක්. දෙවියන්වහන්සේ ඔහු මවා තිබුනා තමයි. ඒත් ඔහු මුදල් ආශාව, වස්තු තෘෂ්ණාව, ජීවනයේ ආශාව සමග උඩගුකම වැනි පාපය තුලින් මා ඔහුව සිරකළා. දැන් ඔහු මට අයිතියි. මහු තමා විසින්ම තමා විකුණුවා'' තියා සිනාසුනා.

“ දෙවියන්වහන්සේට ඔහු මිදවීම සඳහාල නුඹ මට ඔහු විකුණනවාද?'' කියා යේසුස්වහන්සේ ඇසූ සේක.

“ ඔබ ඇයි ඔහුව නිදහස්කරන්න කැමතිවන්නේ, ඔහුගේ මුරණ්ඩුකම ගැන ඔබ දන්නවාද? දෙවියන්වහන්සේ ප්‍රතික්ෂේප කර ඔහුම මාව තම ස්වාමියා ලෙස තෝරාගත්තා! මවනු ලැබූ ආකාරයෙන් ඔහු දැන් නැහැ. මම ඔහුව අක්‍රමවත් හිස් මිනිසෙක් ලෙස මාරු කළා. නුමුත් ඔබ ඇයි ඔහුව නිදහස් කරන්න කැමතිවන්නේ....?''

“ හේතුව ඔබට කියන්න අවශ්‍යතාවයක් මට නැහැ. විකුණනවානම් ගාන කීයද?''

“ කීයක්වුනත් දෙන්න ඔබ සූදානම්ද?'' යක්ෂයා මේක තමයි කදිම අවස්ථාව කියා විනාඩියක් කල්පනාකර ඉතා උද්යෝගීමත්ව “ඔබගේ රුධිරයයි'' කියා පැවසුවා.

ලැබුනාග “හරි... මම දෙන්නම්'' කියා එතුමා පැවසුවා.

“ පාපයල සාතන් විසින් ගෙනෙන වංක හෘද සාක්ෂියල සදාතනික නිරය යන දේවල්වලින් මාව නිදහස්කරන්නට යේසුස්වහන්සේ, මා වැනි



කිසිම දේකට ප්‍රයෝජනයක් නැති කෙනෙකු උදෙසා ඇයි මැරුනේ....? ඔබවහන්සේගේ රුධිරය තුලින් මේ මහත් මිලය ඇයි ගෙව්වේ....? කියා කීපවතාවක්ම මම එතුමාගෙන් විමසුවා.

උන්වහන්සේගේ පිළිතුර වූයේ “ පුතාල මම තුඹට ප්‍රේම කරනවා. තුඹ නිරයට යාම බලා ඉන්න මට බැහැ. තුඹ මා සමග ඉන්න පිනිසයි තුඹව මැව්වේ. තුඹ මගේ නිවහන විය යුතුයි. මේ පොළවේ මා සමග තුඹ ප්‍රීතියෙන් දිවි ගෙවිය යුතුයි. තුඹගේ මේ වෙහෙසකාරී කටුක දිවීම, මේ පොළවේ දී අවසන් වූ පසු, මා සමග ඔබ ඉන්න පිනිස සදාතනික ස්වර්ගරාජ්‍යයට මම තුඹව කැඳවාගෙන යමි.”

මිත්‍රයා... ඔබ උදෙසා යේසුස්වහන්සේ කල්වාරියේදී උන්වහන්සේගේ රුධිරය මිලයක් ලෙස ගෙව්වා. මින්පසු යක්ෂයාට වහල්ව ඉන්න අවශ්‍ය නැහැ. යේසුස්වහන්සේම ඔබ තුළ ජීවත්වීම සඳහා ඔබට කැඳවනබව ඔබ දන්නවාද? පාපයේ ලැජ්ජාවෙන් ඔබ නිදහස් කර, ප්‍රීතියෙන් ඔබ පුරවීමයි උන්වහන්සේගේ පරලොවත් දෙවිඳුන් සමග ඔබට එකතු වී ජීවත්විය හැකියි.



දැන් ඔබ යේසුනී... මගේ ජීවිතයට එතුමැනව කියා කැඳවනවාද?

යාච්ඤාව : යේසුනීල කුරුසියේ මා උදෙසා මැරුන නිසා ස්තුතියි. මාගේ පාපය කමාකර මා පවිත්‍ර කල මැනව. මාව ඔබගේ නිවහන ලෙස වෙනස් කල මැනව. මේ ලෝකයේද පරලෝකයේද ඔබවහන්සේම මාගේ ස්වාමින්වහන්සේය.

ආමේන්

Written by : Bro Saju John Matthew

Churches in Sri Lanka

No. 71B, Cemetery Road,
Kerawalapitiya, Hendala,
Wattala.

No. 53, Rosita Housing Scheme,
Kotagala.

Wevaltalawa,
Yatiyantota.

V C Road, Vantharumoolai,
Batticaloa.

Selvapuram, Mullaitivu.

email : ebpmslmedia@gmail.com